# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2389/12 - 2024 ජුනි මස 19 වැනි බදාදා - 2024.06.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16 (2ඇ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

යෝජිත කාමර 113 කින් සමන්විත පාරිසරික සංචාරක නිකේතන ව්‍යාපෘතිය - එරුමතිවු දූපත, කල්පිටිය

**පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව**

1988 අංක 64 හා 2011 අංක 49 දරන පනත් මගින් සංශෝධිත 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 16(1) වගන්තියේ විධිවිධානවලට අනුකූලව අංක 500/5, තලපත්පිටිය පාර, මාදිවෙල, කෝට්ටේ දරන ලිපිනයේ කන්සල්ටින් ඉංජිනියර්ස් ඇන්ඩ් ආර්කිටෙක්ට්ස් ඇසෝසියේටඩ් පුද්ගලික සමාගම විසින් ඉදිරිපත් කරන ලද පුත්තලම් දිස්ත්‍රික්කයේ කල්පිටිය, එරුමතිවු දූපතේ ඉදිකිරීමට යෝජිත කාමර 113කින් යුත් පාරිසරික සංචාරක නිකේතන ව්‍යාපෘතිය සඳහා වූ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව මහජන පරීක්ෂාව සඳහා පහත සඳහන් ස්ථානවල දිනපතා පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා 2024.06.19 දින සිට දින 30 ක කාලයක් සඳහා තබා ඇත. (සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන් හැර).

මීට අමතරව වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.coastal.gov.lk මගින් එම වාර්තාව භාෂා තුනෙන්ම පරිශීලනය සඳහා ඉදිරිපත් කර ඇත.

01. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය, 12 වන මහල, සෙත්සිරිපාය, අදියර 02, බත්තරමුල්ල.
02. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, 4 වන මහල, නව මහ ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10.
03. මධ්‍යම පරිසර අධිකාරිය, අංක 104, "පරිසර පියස", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
04. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, "සම්පත් පාය" බත්තරමුල්ල.
05. වයඹ පළාත් පරිසර අධිකාරිය, මාළිගාව, කුරුණෑගල.
06. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම.
07. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කල්පිටිය.


1A - G 42081 — 24 (2024/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

08. ප්‍රාදේශීය සභාව, කල්පිටිය.

09. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් කාර්යාලය, පුත්තලම.

10. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය කාර්යාලය, කාකපල්ලිය, හලාවත.

මෙම යෝජිත ව්‍යාපෘතිය නිසා පරිසරය කෙරෙහි වන බැලපෑම් පිළිබඳ ඇගයීම් වාර්තාව සම්බන්ධව මහජන අදහස් 2024.06.19 දින සිට දින 30ක් (සති අන්ත සහ රජයේ නිවාඩු දිනයන් හැර) ඇතුළත වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස දන්වමි.

**ඉංජිනේරු ආර්. ඒ. එස්. රණවක,**
අධ්‍යක්ෂ ජනරාල්,
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ.

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව,
නව මහලේකම් කාර්යාලය,
4 වන මහල,
මාලිගාවත්ත,
කොළඹ 10.

දුරකතන අංක : 011 - 2449754, 011 - 2387922, 011 - 2449197.
ෆැක්ස් අංක : 011 - 2438005, 011 - 2472623.

EOG 06 - 0114

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.